# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2477/43 - 2026 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා - 2026.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී. බී. 12/2008

**2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත**

2 වන වගන්තිය යටතේ වූ නියමය

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 2 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය කේ. එම්. ආනන්ද විජේපාල වන මා විසින්, ජාතික අන්තරායදායක ඖෂධ පාලක මණ්ඩලයේ නිර්දේශය මත, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්ථාන, ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා, රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ මධ්‍යස්ථාන වශයෙන් නම් කරනු ලැබේ.

**කේ. එම්. ආනන්ද විජේපාල,**
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය.

2026 පෙබරවාරි මස 21 වන දින,
කොළඹ දී ය.

1A - G 46362 — 04 (2026/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

***තැනැත්තන් රැකබලා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ මධ්‍යස්ථාන***

1. සිවිල් ආරක්ෂක පුහුණු කඳවුර - මිහින්තලේ;
2. සිවිල් ආරක්ෂක පුහුණු කඳවුර - කල්පිටිය;
3. සිවිල් ආරක්ෂක පුහුණු කඳවුර - පහලලන්ද, අම්පාර;
4. ශ්‍රී ලංකා පොලිස් අභ්‍යාස විද්‍යාලය - කල්ලඩි;
5. කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ පිහිටා ඇති කම්කරු දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පරිශ්‍රය; සහ
6. මහනුවර, කුණ්ඩසාලේ ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයේ ඉලංගකෝන් නේවාසිකාගාරය.

EOG 02 - 0218

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.